# ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
# ஆரம்பக் கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
# MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය : MPI&SE/NSPD/13/01
எனது இல :
My No. :

ඔබේ අංකය :
உமது இல :
Your No. :

දිනය : 2019.11.18
திகதி :
Date :

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2019/05

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>ආබාධ සහිත පුද්ගලයන් සඳහා ආධාරක උපකරණ ලබා දීම/ විශේෂිත උපකරණ සඳහා ආධාර මුදල් ලබාදීම</u>

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉහත වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයින් සඳහා තම කාර්යයන් පහසු කරගැනීමටත්, ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගාසිටුවීමත් බලාපොරොත්තුවේ.

**ආධාරක උපකරණ ලබාගැනීම සඳහා නිර්ණායක (කොමඩ් රෝද පුටු, රෝද පුටු, අත්වාරු, කිහිලිකරු, ඇවිදීමේ රාමු, ඇළුමිනියම් හැරමිටි)**

- පවුලේ මාසික ආදායම රු.6000/-ට වඩා අඩු විය යුතුය.
- ආධාරක උපකරණ ලබා ගැනීමේ අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. (අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිලධාරී නිර්දේශය, උපකරණය අවශ්‍ය බවට හා ආබාධිත බව පිළිබඳ සමාජ සේවා නිලධාරී නිර්දේශය, උපකරණය ලබා දීමට සුදුසු බවට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය)
- ආබාධිත බව පැහැදිලිව සඳහන් වන සේ රජයේ වෛද්‍යවරයෙකුගෙන් හෝ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකය නිලමුද්‍රාව සහිතව තිබිය යුතුය. (පිටපත් එවන්නේ නම් ග්‍රාම නිලධාරී/ සමාජ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී විසින් සත්‍ය පිටපතක් බව සහතික කළ යුතු අතර, රෝග නිශ්චය තුණ්ඩු සලකා බලනු නොලැබේ.)

**විශේෂිත උපකරණ සඳහා නිර්ණායක (වායු මෙට්ට, කෘතිම පාද, ජල මෙට්ට, විශේෂ සපත්තු ආදිය)**

- ➢ විශේෂ උපකරණ සඳහා උපරිම රු.20,000/-
- ➢ ශ්‍රවණ උපකරණ සඳහා අවු 18 ට අඩු උපරිම රු.35,000/-
- ➢ ශ්‍රවණ උපකරණ සඳහා අවු 18-60 දක්වා උපරිම රු.15,000/-

- පවුලේ මාසික ආදායම රු.6000/-ට වඩා අඩු විය යුතුය.
- ආධාරක උපකරණ ලබා ගැනීමේ අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. (අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිලධාරී නිර්දේශය, උපකරණය අවශ්‍ය බවට හා ආබාධිත බව පිළිබඳ සමාජ සේවා නිලධාරී නිර්දේශය, උපකරණය ලබා දීමට සුදුසු බවට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය)
- ආබාධිත බව පැහැදිලිව සඳහන් වන සේ රජයේ වෛද්‍යවරයෙකුගෙන් හෝ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකය නිලමුද්‍රාව සහිතව තිබිය යුතුය. (පිටපත් එවන්නේ නම් ග්‍රාම නිලධාරී/ සමාජ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී විසින් සත්‍ය පිටපතක් බව සහතික කළ යුතු අතර, රෝග නිශ්චය තුණ්ඩු සලකා බලනු නොලැබේ.)


| | | |
|---|---|---|
| අමාත්‍ය/அமைச்சர்/Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2861 145 | ෆැක්ස්/பெக்ஸ்/Fax : 011 - 2884 613 |
| රාජ්‍ය අමාත්‍ය/இராஜாங்க அமைச்சர்/State Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2877 841 | ෆැක්ස්/பெக்ஸ்/Fax : 011 - 2877 606 |
| නියෝජ්‍ය අමාත්‍ය/ பிரதி அமைச்சர்/Deputy Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2877 121 | ෆැක්ස්/பெக்ஸ்/Fax : 011 - 2877 126 |
| ලේකම්/செயலாளர்/Secretary | දුරකථන/தொ.பே./Tel. : 011 - 2883 525 | ෆැක්ස්/பெக்ஸ்/Fax : 011 - 2187 007 |
| අමාත්‍යාංශ කාර්යාලය /அலுவலகம்/General Office | දුරකථන/தொ.பே./Tel. : 011 - 2887 349-51 | ෆැක්ස්/பெக்ஸ்/Fax : 011 - 2877 127 |

අමාත්‍යාංශය 1වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල.
அமைச்சு 1ஆவது மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை.
Ministry 1st Floor, Sethsiripaya Stage II, Battaramulla.

විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-Mail : msesecretary@sltnet.lk
වෙබ් අඩවිය/இணையத்தளம்/Website: www.socialemwelfare.gov.lk

- ආබාධිත බව පැහැදිලිව සඳහන් වන සේ රජයේ වෛද්‍යවරයෙකුගෙන් හෝ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකය නිල මුද්‍රාව සහිතව තිබිය යුතුය. (පිටපත් එවන්නේ නම් ග්‍රාමනිලධාරී/ සමාජ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී විසින් සත්‍ය පිටපතක් බව සහතික කළ යුතු අතර, රෝග නිශ්චය තුණ්ඩු සලකා බලනු නොලැබේ.)
- අදාළ උපකරණය ලබා ගැනීමට නියමිත ආයතනයෙන් ලබා ගත් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය. (ඔසුසලින් ලබා ගත නොහැකි උපකරණයක් නම් පමණක් පුද්ගලික ආයතනයකින් ලබා ගත් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය.)
- මෙම ආයතනයෙන් ලබා දීමට නියමිත ආධාර මුදලට වඩා වැඩි මුදලක් උපකරණය සඳහා වැය වන්නේ නම් එම මුදල සපයා ගන්නා ආකාරය පිළිබඳ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

❖ **දුර හා ළඟ පෙනෙන ඇස් කණ්ණාඩි (BIFOCAL) ලබා ගැනීම**

- පවුලේ මාසික ආදායම රු.6000/-ට වඩා අඩු විය යුතුය.
- ආධාරක උපකරණ ලබා ගැනීමේ අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. (අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිලධාරී නිර්දේශය, උපකරණය අවශ්‍ය බවට හා ආබාධිත බව පිළිබඳ සමාජ සේවා නිලධාරී නිර්දේශය, උපකරණය ලබා දීමට සුදුසු බවට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය)
- අක්ෂි වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය වට්ටෝරුව (MEDICAL PRESCRIPTION) ඉදිරිපත් කළ යුතුය.

**සැලකිය යුතු වෙනත් කරුණු,**

- ආධාරක උපකරණ සීමිත සංඛ්‍යාවක් ලබා ගන්නා අතර, ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබෙන බැවින් අයදුම්කරුවන්ගේ ප්‍රමුඛතාවය මත උපකරණ ලබා දේ.
- සෑම විටම උපකරණ ප්‍රවාහනය කරදීමට පහසුකම් නොමැති අතර, එම අවස්ථාවලදී දුරකතන ඇමතුමක් ලබා දී සනාථ කිරීමෙන් පසුව මෙම කාර්යාලයට පැමිණ ලබා ගත යුතුය.
- විශේෂ උපකරණ ලබා ගැනීමේදී බිල්පත හා සේවාලාභී වාර්තාව මෙම කාර්යාලට ලද පසු චෙක්පතක් මගින් අදාල ආයතනයට අනුමත කරන ලද මුදල ලබා දේ.

**සම්පූර්ණ කරන ලද අයදුම්පත එවිය යුතු ලිපිනය**
අධ්‍යක්ෂ අබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය
පළමු මහල,
සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල

**වැඩිදුර විස්තර සඳහා**
දුරකතන අංකය: 011-2877374
විද්‍යුත් ලිපිනය :
mssnspd@gmail.com

අශෝකා අලවත්ත
ලේකම්

පිටපත්: 1. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු - කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
2. අධ්‍යක්ෂ සමාජ සේවා දෙපාර්තමේන්තුව - කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
3. දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී - අදාළ අයදුම්පත මේ සමඟ එවමි.